
ඔබේ නම
ලියාපදිංචි කර තිබේද?

# ඔබේ නම ලියාපදිංචි කර තිබේද?



ඔබ මෙලොව උපන්විට ඔබේ දෙමාපියන් ඔබේ  නම උපත් සහ මරණ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ. එමෙන්ම ඔබේ නම තවත් බොහෝ තැන්වල ලියාපදිංචි කර ඇත. උදා:

- ඔබ පාසලට ඇතුල් කිරීමේදී
- ඔබ රැකියාවක් සඳහා තොරගනුලැබූ විට
- ඔබ නිවාස දේපල මිලයට ගන්නා විට
- ඔබේ වාහන රක්ෂණය කරන විට
- ඔබ  බැංකු ගිණුමක් ආරම්භකරනවිට
- ඔබ සලාක පත්‍ර ලබාගන්නාවිට
- ඔබේ නම චන්ද ලැයිස්තුවට නම ඇතුලත්කරනවිට
- ඔබේ නිවසට විදුලිය සපයගන්නාවිට

මේ විනාශවෙමින් පවතින ලෝකයේ ජීවත්වීමට ඔබේ නම නොයෙක් තැන්වල ලියාපදිංචි කලයුතු නම්, ස්වර්ගය පිලිබඳ කෙසේ විය යුතුද? මරණින් පසු දුෂා නොවන සදකාලයෙහි සතුටින් හා සාමයෙන් වාසය කරන පිණිස ඔබගේ නම ස්වර්ගයෙහි ලියාපදිංචිවීම අවශ්‍ය නොවේද? ඔව්, ඇත්තටම ඔබේ නම දැන්ම එහි ලියාපදිංචි විය යුතුමය.



ඔබේ නම එහි ලියාපදිංචි කිරීම සඳහා ඔබ කුමක් කළ යුතුද? එහි ඔබේ නාමය ලියාපදිංචි කිරීම සඳහා, ඔබ ස්වර්ගීය පවුලේ සාමාජිකයෙක් ලෙස උපත ලැබිය යුතුයි. මේ ගැන ශුධවූ බයිබලයේ මෙලෙස ලියා තිබේ : ''..උන්වහන්සේ පිළිගත් සියල්ලන්ට එනම්, උන් වහන්සේගේ නාමය අදහාගත් අයට, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන්වහන්සේ දේවා වදාළ සේක.'' (යොහාන් 1:12). ඔබ ස්වාමිවූ යේසුස් මුළු හදින්ම අදහාගෙන ඔබගේ පුද්ගලික ගැලවුම්කරු සහ ස්වාමින් ලෙස උන්වහන්සේ පිලිගන්නේනම්, ඔබ උන්වහන්සේගේ දරුවෙක් වන්නේය.  කල්වාරි කුරුසියේ ඔබ විසින් ඔබගේ පාපයන්ට විදිය යුතුවූ දඬුවම ඔබ වෙනුවෙන් වින්ද දරා ගෙන ඔබ වෙනුවෙන් උකුත්වූයේ උන්වහන්සේමය. උන්වහන්සේ උකුත්වුවා පමණක් නොවේ, දින තුනකට පසු නැවත උත්ථානවී දැන් සදහටම ජීවත්වනසේක. තරුණ වයසේ සිට ඔබ කල පාප එකිනෙක ඔබ පවසා සිටියොත්, උන්වහන්සේ ඔබගේ පාප කමකොට ඔබ උන්වහන්සේගේ දරුවෙක් ලෙස පිළිගනී. එතුමා ඔබගේ හද ප්‍රීතියෙන් හා සාමයෙන් පුරවන්නේය. මේ අන්දමට දේව දරුකම ලබාගත් අයට, උන්වහන්සේ මෙලොව වැඩසිටි කාලයේදී මෙසේ පැවසුවා:'' ... ඔබගේ නාම ස්වර්ගයෙහි ලියා ඇති නිසා සන්තෝෂ වන්න'' (ලූක් 10:20).



යේසුස් ස්වාමින් අදහාගෙන පව් කමාව ලබාගත් අයගේ නම් ස්වර්ගයෙහි ලියාපදිංචිවී තිබේ. තවදුරටත් බයිබලය පවසන අන්දමට ,“දෙවියන් වහන්සේගෙන් උපත ලැබූ කිසිවෙක් පව් නොකරති....’’ (1 යොහාන් 3:9) යේසුස් ස්වාමින් එවැන්නන්ට මෙම දූෂිත ලෝකයේ තවදුරටත් පව් නොකරමින් පිරිසිඳු ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය අනුග්‍රහය දානය කරයි. ඊට අමතරව, යේසුස් ස්වාමින් කුරුසියේදී උකුත්වුවිට, උන්වහන්සේ ඔබේ පාප පමණක් නොව රෝගද දරාගත්සේක. ඒ අනුව උන්වහන්සේ කෙරෙහි අදහගන්නා අයට සුවකළ  නොහැකි රෝගවලින් පවා මිදී නිරෝගී දිවියක් ගතකල හැකිවේ.



මෙය මෙලෙස සිදුවන්නේහිනම්, ස්වර්ගයෙහි තමුන්ගේ නාමයන් ලියාපදිංචි වී නැති අයගේ අවසානය කුමක්ද? මරණයෙන් පසු, විනිශ්චයේදී ඔවුන්ට සිදුවන්නට යන දේ පිළිබඳව මෙලෙස ලියා ඇත. “යමෙකුගේ නම ජීවන-පොතෙහි ලියා නැති බව සම්බවීද, ඔහු ගිනිවිලට හෙළනු ලැබූවේය.” (එළිදරව් 20:15) යේසුස්ගේ රුධිරය ඔබට ඔබේ පාප දුරුකරමින් සමාව ලබාදේ. උන්වහන්සේගේ කුරුසිය ඔබගේ ශාපය ඉවත්කර ආශීර්වාදය ලබාදේ. උන්වහන්සේ ලැබූ කසපහර ඔබට නිරෝගිබව ලබාදේ. උන්වහන්සේගේ මරණය ඔබ

මරණ භයින් මුදවා ඔබට එඩිතරබව අත්කරදේ. යේසුස් වනහසේගේ ජීවනයෙන් ඔබට සදාකාලික ජීවනයද ලැබේ. ඔබේ නම මෙලොව නොව, ස්වර්ගයෙහි තබා තිබෙන ජීවන පොතේ ලියැවී තිබේ. අදම ස්වාමිවූ යේසුස් වෙත පැමිණ



ලෝකයට දිය නොහැකි නියම සාමය සහ ප්‍රීතිය  හා මරණින් පසු ස්වර්ගයට ඇතුල්වීමට ඇති වරමද ලබාගන්න. යේසුස් වහන්සේ අදහගනිමින් මෙම යාඥාව කරන්න:

**යාඥාව :**

**"යේසුස් ස්වාමිනි, මම ඔබ විශ්වසකරමින් මගේ මුළු දිවියම ඔබට සතු කරමි. ඔබගේ ශුධවූ රුධිරයෙන් මා පවිත්‍රකොට විශුධ කළ මැනව.**



**මා ඔබේ දරුවෙකු ලෙස බාරගෙන මගේ නම දැන්ම ස්වර්ගෙහි ලියාපදිංචි කරනු මැන. මින්මත්තට, මගේ මුළු දිවිය තිබෙන තුරා, මම ඔබගේ දරුවෙකු ලෙස ජීවත්වෙමි. ආමෙන්."**

